# කන්දොස්කිරියාව . . .



## ගොම්බෙට්ට

හතරකෝරලේ ගෙදර සෝමපාල කොළුවගේ හීන් එකී දීගෙක දෙනවා කියලා සෝමපාලයි උගේ මායියයි ඊයේ හැන්දෑකොරේ මට බුලත් දෙන්ට ආවා නොවැ. ලබන මාසේ දොලොස් වෙනිදා කුරුණෑගල මහ හෝටලේක මඟුල පියටම ගන්නවලු. බුලත් එක්ක උජාරුවට හදපු මඟුල් කාඩ් කෑල්ලකුත් දීලා ගියා. අපේ පරම්පරාවේ ජීවතුන් අතර ඉන්න වැඩිමාලුම එකා මං හින්දා චාරිත්තරේට බුලත් දෙන්ට එන්ට ඇති. ඒත් ඉතින් දැං ඕව්වට මට යන්ට එන්ට අමාරුයි. කොහොම උනත් මඟුලට කලින් උන්දැලාගෙ ගෙදට්ට ගිහින් කීයක් හරි දෙන්ට ඕනෑ.

මගුල් කියනකොට මට මතක් වෙන්නේ රතුකොහො ගෙදර කව්රාලගේ හීන් කෙලීට බීන්නට ඉලන්දාරියෙක් හොයාගත්තු හැටි. පනස් ගනං වල විතර දොරම්යාවයායේ බිං නැගුං හාන දවසක ඇලවේල්ල දිගේ උඩහට ගිය ඉලංදාරියෙක් ඇළවේල්ලේ තිබ්බ ගොම්බෙට්ටක් කකුලෙන් අරං බිං නැගුං හාන කුඹුරට තල්ලු කරගෙන කිසි කතා බහක් නැතුව ගිහින් තියෙනවා. ඒ වේලාවේ කව්රාල කල්පනා කරාලු ගොම්බෙට්ටක අගේ දන්න මේකා හොඳයි මගේ බෑනා කරගන්ට කියලා.

පහුවදාම කව්රාල විපරං කරලා තියෙනවා ඊයේ ආපු ඉලන්දාරියා කොහාටද ගියේ කියලා. ඊට පස්සේ දැනගෙන තියෙනවා ඌ උල්ලඹුපිටිය ගමේ ඉලංදාරියෙක් බව. පස්සෙන් පහු උගේ වතගොත හොයාගෙන බලාපුහාම ජාතියෙන් පම්මෙන් ගැලපෙන එකෙක් හින්දා මඟුල කතාකොරලා තීන්දු කරලා තියෙනවා: ඊට පස්සේ ඒ ඉලන්දාරියා කව්රාලලාගේ ගෙදර බීනි බස්සවා ගත්තා.

මාමන්ඩිගෙන් තමුන්ට උරුම වෙච්ච් ගොඩමඩ ඉඩකඩං දියුණු කළේ ඔය ඉලන්දාරියා තමයි. ඌ දාඩිය මහන්සියෙන් දේපොල ආරක්සා කර ගත්තා. පුදුම අත් ගුණයක් ඌට තිබුණා. ඒකාලේ ආණ්ඩුවේ වගා තරගෙකින් පළවෙනි තැනටත් ඌ තේරුණා. උගේ දරුවෝ තුන්දෙනාම හොඳට ඉගෙන ගෙන දැන් ලොකු රස්සාවල් කරනවා.

ගොම බෙට්ට කියන එක අද නං කව්රුත් ගනං ගන්නේ නැති දෙයක් උනත් ඒ කාලේ ගොම බෙට්ටක අගේ ගොයියෝ දැනගෙන හිටියා. දැන් කාලේ පොඩි එවුන් ගොම්බෙට්ටක් දැකලත් නැතුව ඇති. ලිපේ ගාන්ට ගොම්බෙට්ටක් හොයාගන්න එකත් දැං ලේසි නෑ. දැන් කාලේ ඔය ගොම්පෝස් කිය කියා කයිවාරු ගහ ගහ බෝගවලට රට පොහොර දාන වැඩේ තමයි හුඟ දෙනෙක් කරන්නේ. කොයි හැටි වෙතත් අපි ආරක්සා කරන මහපොළවට කෙළෙහිගුණ සලකන හැටි කල්පනා කරන්ට කාලේ ඇවිල්ලා කියලයි මටනං හිතෙන්නනේ. අම්මපා......

සීලිං අන්නා.